අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

ඉසුරුපාය, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112784846
isurupaya@moe.gov.lk | www.moe.gov.lk


මගේ අංකය / எனது இல. / My Ref. ED/05/67/28/06 (IV වෙළුම) | ඔබේ අංකය / உமது இல. / Your Ref. | දිනය / திகதி / Date 2024/02/ 14

සියළුම විදුහල්පතිවරුන් / පීඨාධිපතිවරුන් / ගුරු විදුහල්පතිවරුන්
/ගුරු මධ්‍යස්ථාන කළමනාකරුවන්

<u>ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයේ (PL-I) සහ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවක ගණයේ (PL-2) කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2023(1) සඳහා කැඳවීම් ලිපිය</u>

ඔබ විද්‍යාලයේ/පීඨයේ/ගුරු මධ්‍යස්ථානයේ/ ගුරු විද්‍යාලයේ සේවය කරන ඇමුණුම 1හි නම් දක්වා ඇති සේවක මහත්ම මහත්මීන් විසින් උක්ත විභාගය සඳහා යොමු කරන ලද අයදුම්පත් අනුව 2024.02.27 හා 28 යන දිනයන් හි අධ්‍යාපන අමාත්‍යාංශ පරිශ්‍රයේදී පවත්වනු ලබන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා පෙනී සිටින ලෙස ඔවුන් දැනුවත් කරන ලෙස මෙයින් දන්වමි.

02. ඒ අනුව ඇමුණුම් 1හි දක්වා ඇති සියළුම ඉල්ලුම්කරුවන් තම නම ඉදිරියෙන් දක්වා ඇති සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය අනුව අදාල කාලපරිච්ඡේදය තුළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් විය යුතු අතර, මෙම විභාගය පැවැත්වෙන කාලසටහන පිළිබඳව අමාත්‍යාංශ නිල වෙබ් අඩවිය ඔස්සේද ප්‍රදර්ශනය කෙරෙනු ඇත.

03. තවද නියමිත දිනට විභාගයට පෙනී සිටීම අනිවාර්ය වන බවත් විභාගයට පෙනී සිටින අවස්ථාවේදී සියළුම අයදුම්කරුවන් විසින් පරීක්ෂණ මණ්ඩලය වෙත පහත දක්වා ඇති ලේඛන ඉදිරිපත් කිරීමටද අනිවාර්ය වන බවත් සියළුම විභාග අයදුම්කරුවන් වෙත දැනුම්දීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

1. පත්වීම් ලිපිය/ ලිපි වල මුල් පිටපත්/ සහතික කල පිටපත්
2. අන්තර්ග්‍රහණ ලිපියක් නිකුත්කර ඇත්නම් එහි මුල් පිටපත්/ සහතික කල පිටපත්
3. ජාතික හැඳුනුම්පත/ වලංගු රියදුරු බලපත්‍රය හෝ ගුවන් ගමන් බලපත්‍රය
4. උසස්වීම් ලබා ඇත්නම් එහි ලිපිවල මුල් පිටපත්/ සහතික කරන ලද පිටපත්
5. මීට පෙර කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් සමත්ව ඇත්නම් එහි ප්‍රතිඵල ලේඛන වල මුල් පිටපත් හෝ සහතික කළ පිටපත්

කේ.ඒ.ඒ. ඉන්ද්‍රරත්න
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ඒකාබද්ධ සේවා නොවන)
ලේකම් වෙනුවට